# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2108/35 – 2019 ජනවාරි 30 වැනි බදාදා – 2019.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ගිණිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වන අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ගිණිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් තීරණ, ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥා පනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2019 පෙබරවාරි මස 01 වන දින සිට වලංගු විය යුතුය.

ආර්. පී. ආර්. රාජපක්ෂ,
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2019 ජනවාරි මස 29 වැනි දින,
කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

ගිණිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1947 මැයි මස 30 වැනි දින අංක 9708 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2013 මාර්තු 07 දින අංක 1800/27 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූද, තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

II වැනි කොටස

**I කාල මිම්මේ වැඩ සඳහා වූ අවම වේතන ප්‍රමාණය**

I වැනි තීරයෙහි නිශ්චිතව සඳහන් කම්කරුවන්ට වැඩ කරන සාමාන්‍ය දිනකට අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II වැනි තීරයෙහි අනුරූප සටහනෙහි දැක්වෙන ප්‍රමාණය විය යුතු ය.

| *I තීරය* *කම්කරුවන්ගේ පංතිය* | | *II තීරය* |
|---|---|---|
| *ශ්‍රේණිය* | *සේවක කාණ්ඩ* | *දිනකට ගෙවිය යුතු ප්‍රමාණය* *රු. ශත* |
| I වැනි ශ්‍රේණිය | මැෂින් ඩ්‍රයිවරයෙන් කූරු කැපීම, මැෂින් ඩ්‍රයිවරයෙන් කූරු පට්ට, ලාච්චු පතුරු, පෙට්ටි පතුරු හා අඩු පතුරු කැපීම, මැෂින් ඩ්‍රයිවරයෙන් පිහියා හා මෙවලම් මුවහත් කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් රූප රාමුවල කූරු සවිකිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් කූරුවලට බෙහෙත් පෙවීම, මැෂින් ඩ්‍රයිවරයෙන් පෙට්ටිවලට බෙහෙත් ගෑම, මිශ්‍රණයෙන් ගිණිකූරු බෙහෙත් කලවම් කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් කඩදාසි කූරු කැපීම, ඕවර්සියර් හෝ කංකානම් වැඩ, මැෂින් ඩ්‍රයිවරයෙන් පෙට්ටි පිරවීම. | 540.00 |
| II වැනි ශ්‍රේණිය | අතින් හරස් අතට කපා කුට්ටි කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් හරස් අතට කපා කුට්ටි කිරීම, කූරු මට්ටම් කිරීම, කපනයෙන් ලාච්චු පතුරු පෙට්ටි පතුරු අඩි පතුරු කැපීම, යන්ත්‍රානුසාරයෙන් පෙට්ටි ලාච්චු සෑදීම අත් උදව්කරුවකු මගින් යන්ත්‍රානුසාරයෙන් පිහියා හෝ මෙවලම් මුවහත් කිරීම, කූරු වලට අතින් පැරපින් තෙල් පෙවීම, රාමුවලින් කූරු හලා ගැනීම, පෙට්ටි අංශවල බෙහෙත් ගෑම, පිරවූ පෙට්ටි පරීක්ෂා කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් මුද්‍රා පටි ඇලවීම, පෙට්ටි අංශවල ගානා බෙහෙත් කවලම් කිරීම, පිට පෙට්ටි යන්ත්‍රයෙන් සෑදීම, පෙට්ටි පිරවීමට යන්ත්‍රානුසාරයෙන් පෙට්ටි යැවීම, බෙහෙත්වලට අතින් කූරු එබීම. | 520.00 |
| III වැනි ශ්‍රේණිය | කාවල්කාර වැඩ හැර ඉහත I වැනි ශ්‍රේණියේ හෝ II වැනි ශ්‍රේණියේ නිශ්චය කොට නැති (ගිනි පෙට්ටි සෑදීමේ ව්‍යාපාරයේ) සියලු කම්කරුවන්ගේ වැඩ | 500.00 |
| I වැනි ශ්‍රේණිය | කාවල්කාර වැඩ | 540.00 |

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවවිසින් ඇති කරන ලදුව, මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2019 පෙබරවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

**ආර්. පී. ආර්. රාජපක්ෂ,**
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2019 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ 05,

*උපලේඛනය*

මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලදුව, වර්ෂ 1966 දෙසැම්බර් මස 09 වැනි දින අංක 14725 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ සහ අවසන් වරට, 2013 මාර්තු මස 07 දින අංක 1800/27 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූ ද, තීරණ එහි 11 වන කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

II කොටස

**මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

**I වන ශ්‍රේණිය :**

ප්‍රධාන කම්කරුවෝ නොහොත් ප්‍රධානියෝ අංශ පරිපාලකවරු, ලේයින් මැෂින් ක්‍රියාකරවන්නෝ.

**II වන ශ්‍රේණිය :**

කියර් බොයිලේරු ක්‍රියාකරවන්නෝ, වාෂ්ප බොයිලේරු ක්‍රියාකරවන්නෝ, සෝදන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, සායම් පොවන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, ස්ටෙන්ටරින් යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, මිරිකන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, කැලැන්ඩර කරන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, වේලන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, යන්ත්‍ර මැකැනික්වරු (සාමාන්‍ය), සායම් පොවන්නෝ (පිරිමි), ගොතන යන්ත්‍ර මැකැනික්වරු, ස්ක්‍රීන් මුද්‍රණකරුවෝ, ස්ක්‍රීන් මුද්‍රණ ක්‍රියාකරවන්නෝ (ගැහැණු), ස්ක්‍රීන් මුද්‍රණ කරන සහායකයෝ, මහන යන්ත්‍ර මිකැනික්වරු.

**III වන ශ්‍රේණිය :**

රෙදි අතුරන කම්කරුවෝ (ගැහැණු), කපන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, විදුලි බලයෙන් ක්‍රියාකරන කපන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, කපන්නෝ (අතින්), මහන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, රෙදි තම්බන කම්කරුවෝ, සුදු කරන්නෝ (පිරිමි) ගොතන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, අලුත්වැඩියා කරන කම්කරුවෝ (ගැහැණු), ට්‍රිම් කරන කම්කරුවෝ (ගැහැණු), මදින කම්කරුවෝ (ගැහැණු), මදින කම්කරුවෝ (පිරිමි), විදුලි බලයෙන් රෙදි මදින යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, හරි වැරදි බලන කම්කරුවෝ (ගැහැණු), තෝරන කම්කරුවෝ (ගැහැණු), අසුරන්නෝ, අසුරන හා මුද්‍රා තබන කම්කරුවෝ (ගැහැණු), සපත්තු ලේස් කෝඩ් සාදන සහ වෙන්කරන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, සෙලෝපේන් මලු සහ කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, ඔතන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ.

**IV වන ශ්‍රේණිය :**

ආධුනිකයෝ හෝ වෘත්තීය හදාරන්නෝ.

(ඉහත සඳහන් වෘත්තීය හදාරන්නෝ හෝ ආධුනිකයෝ සම්බන්ධයෙන් ආධුනික කාලය වැඩ කරන දින 156 කින් යුක්ත වූ කාලසීමාවන් ලෙස සැළකිය යුතු ය.)

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| *සේවා වසර* | *I ශ්‍රේණිය රු. ශත* | *II ශ්‍රේණිය රු. ශත* | *III ශ්‍රේණිය රු. ශත* | *IV ශ්‍රේණිය රු. ශත* |
|---|---|---|---|---|
| 1 වන වසර | 13,035.00 | 12,514.00 | 12,000.00 | 7,500.00 |
| 2 වන වසර | 13,185.00 | 12,639.00 | 12,100.00 | |
| 3 වන වසර | 13,335.00 | 12,764.00 | 12,200.00 | |
| 4 වන වසර | 13,485.00 | 12,889.00 | 12,300.00 | |
| 5 වන වසර | 13,635.00 | 13,014.00 | 12,400.00 | |

02 - 496/2

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව මෙම උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2019 පෙබරවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

ආර්. පී. ආර්. රාජපක්ෂ,
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2019 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1961 අගෝස්තු මස 25 වැනි දින අංක 12617 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කළ වෙනස් කරන ලද්දා වූ ද සහ අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

II වැනි කොටස

ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තයේ නියුක්ත සේවක පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය සහ අවම මාසික වේතන ප්‍රමාණය පහතින් දක්වා ඇත.

**සේවකයින්ගේ පන්තිය**

**පුහුණු කම්කරුවෝ I වැනි ශ්‍රේණිය :**

ප්‍රෙස් යන්ත්‍රයට මැටි සපයන්නෝ (යන්ත්‍රයෙන්) පෝරණුවලට ගින්දර දමන්නෝ (දහකයෙන්)

**පුහුණු කම්කරුවෝ II වැනි ශ්‍රේණිය :**

ප්‍රෙස් යන්ත්‍රයට මැටි සපයන්නෝ (අතින්) පිළිස්සීම සඳහා පෝරණුව තුළ උළු පැටවීමේ සහ කඳු ගැසීමේ යෙදෙන්නෝ, තෝරා වෙන්කරන්නෝ.

**අර්ධ පුහුණු කම්කරුවෝ :**

දබර කරකවන්නෝ, කට්ටි කපන්නෝ, උළු කට්ටවලට තෙල් ගාන්නෝ සහ මට්ටම් කරන්නෝ, සාහින්නෝ, අමු උළු තෝරා වෙන්කරන්නෝ, ගෙනයාම සඳහා උළු වාහනවලට ගොඩ ගසන්නෝ.

**නුපුහුණු කම්කරුවෝ :**

මැටි කලවම් කිරීමේ සහ පැගීමේ යෙදී සිටින කම්කරුවෝ, ට්‍රක් පුරවන්නෝ, මැටි කරුවෝ, කට්ටි ගෙනයන්නෝ, යන්ත්‍රයෙන් මිශ්‍ර කිරීමේ දී හා අත් ගැසීමේ යෙදී සිටින කම්කරුවෝ, රාක්කවලට උළු ගොඩගැසීමේ යෙදී සිටින කම්කරුවෝ, උළු හිරු රැසින් වේලීමේ යෙදී සිටින කම්කරුවෝ, උළු තෝරා වෙන්කරන්නන්ගේ අත් උදව්කරුවෝ, අමු උළු තෝරා වෙන්කරන්නන්ගේ අත් උදව්කරුවෝ, දර අදින්නෝ, අත්ගසන යන්ත්‍රයට මැටි සපයන්නෝ, උළු කඳු ගසන්නෝ, ප්‍රෙස් යන්ත්‍රවලට හෝ ගබඩාවේ අනෙක් කොටස්වලට මැටි කට්ටි ගෙන යන්නෝ, පිලිස්සීම සඳහා පොර්ණුව තුළ උළු පැටවීමෙහි සහ කඳු ගැසීමෙහි යෙදෙන්නන්ගේ අත් උදව්කරුවෝ.

**අවම දෛනික වේතන ප්‍රමාණය**

| I තීරය<br>සේවකයාගේ පන්තිය | II තීරය<br>ප්‍රමාණය<br>රු. ශත |
|---|---|
| පුහුණු කම්කරුවෝ I ශ්‍රේණිය | 532.00 |
| පුහුණු කම්කරුවෝ II ශ්‍රේණිය | 503.00 |
| අර්ධ පුහුණු කම්කරුවෝ | 474.00 |
| නුපුහුණු කම්කරුවෝ | 445.00 |

**අවම මාසික වේතන ප්‍රමාණය**

| සේවකයාගේ පන්තිය | 1 වසර<br>රු. ශත | 2 වසර<br>රු. ශත | 3 වසර<br>රු. ශත | 4 වසර<br>රු. ශත | 5 වසර<br>රු. ශත |
|---|---|---|---|---|---|
| පුහුණු කම්කරුවෝ I ශ්‍රේණිය | 13,302.00 | 13,477.00 | 13,652.00 | 13,827.00 | 14,002.00 |
| පුහුණු කම්කරුවෝ II ශ්‍රේණිය | 12,578.00 | 12,728.00 | 12,878.00 | 13,028.00 | 13,178.00 |
| අර්ධ පුහුණු කම්කරුවෝ | 11,852.00 | 11,977.00 | 12,102.00 | 12,227.00 | 12,352.00 |
| නුපුහුණු කම්කරුවෝ | 11,126.00 | 11,226.00 | 11,326.00 | 11,426.00 | 11,526.00 |

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥා පනතේ 30 වැනි වගන්තිය යටතේ මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥා පනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2019 පෙබරවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

**ආර්. පී. ආර්. රාජපක්ෂ,**
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2019 ජනවාරි මස 28 වැනි දින,
කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

උපලේඛනය

මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1947 පෙබරවාරි මස 14 වැනි දින අංක 9667 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, සහ අවසන් වරට 2013 මාර්තු මස 07 වැනි දින අංක 1800/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්ද වූ තීරණ පහත දැක්වෙන පරිදි තවදුරටත් එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතු ය.

**II වැනි කොටස**

**කම්කරුවාගේ පන්තිය**

**ඒ පන්තියේ කම්කරුවෝ**

මගීන් 22කට වැඩියෙන් ගෙනයාමට අවසර ලත් බස්රථ රියැදුරෝ.

**බී පන්තියේ කම්කරුවෝ**

මගීන් 22ක් හෝ ඊට අඩු ගණනක් ගෙනයාමට අවසර ලත් බස්රථ රියැදුරෝ, ගිලන් රථ රියැදුරෝ හා හොණ්ඩර 20කට වැඩි බර ගෙන යාමට අවසරලත් ලොරි (වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ලොරි හැර) හා වෑන් රථ රියැදුරෝ,

**සී පන්තියේ කම්කරුවෝ**

කුලී කාර් සහ කැබ් රථ රියැදුරෝ, හොණ්ඩර 20 හෝ ඊට අඩු බරක් ගෙන යාමට අවසරලත් ලොරි (වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ලොරි හැර) හා වෑන් රථ රියැදුරන්, ත්‍රීරෝද රථ රියැදුරන් හා මිනී රථ රියැදුරන්,

**ඩී පන්තියේ කම්කරුවෝ**

ප්‍රවාහන කාර්යයන් සඳහා යොදවනු ලබන ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් රථ පදවන රියැදුරෝ හෝ ට්‍රේලර් සහිත ලොරි පදවන රියැදුරෝ (ස්කැමල් හෝස් වර්ගයේ ඒවා ඇතුළුව - එහෙත් වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ ට්‍රේලර් සහිත ලොරි, ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් හැර)

**ඊ පන්තියේ කම්කරුවෝ**

වත්තකට අයිති වූ හා එම වත්තෙහි අභ්‍යන්තර ගමනාගමනයෙහි පමණක් යොදවන්නා වූ පහත සඳහන්වන රථවල රියැදුරෝ, එනම් (අ) ලොරි සහ (ආ) ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් රථ,

**එෆ් පන්තියේ කම්කරුවෝ**

බස්රථවල නියුක්ත කොන්දොස්තරවරු, ලිපිකරුවෝ, කැෂියර්වරු, ප්‍රවේශපත්‍ර ලිපිකරුවෝ, ආසන වෙන් කරන ලිපිකරුවෝ.

**ජී පන්තියේ කම්කරුවෝ**

හොණ්ඩර 20කට වැඩි බර ගෙන යාමට අවසරලත් ලොරිවල ක්ලීනර්වරු සහ පෝටර්වරු.

**එච් පන්තියේ කම්කරුවෝ**

හොණ්ඩර 20 හෝ ඊට අඩු බරක් ගෙන යාමට අවසරලත් ලොරිවල සහ බස්රථ, කුලී කාර්, කැබ් රථ, වෑන් රථ, ගිලන් රථ හා මිනී රථවල ක්ලීනර්වරු සහ පෝටර්වරු.

**අයි පන්තියේ කම්කරුවෝ**

බස්රථ චෙකර්වරු හෝ වේලාව තබන්නෝ.

**ජේ පන්තියේ කම්කරුවෝ**

බස්රථ පරීක්ෂකවරු සහ නැවතුම්පලවල පරිපාලකවරු.

**කේ පන්තියේ කම්කරුවෝ**

මෝටර් රථ ගමනාගමන කර්මාන්තයෙහි යෙදී සිටින එහෙත්, මෙහි ඉහත කොටස්වල සඳහන් නොවූ කම්කරුවෝ.

ඉහත සඳහන් තීරණවල -

(අ) ''ක්ලීනර්වරු'' යන්නෙන් ලොරි, බස්රථ, කුලී කාර්, කැබ් රථ, වෑන් රථ, ගිලන් රථ හෝ මිනී රථ පිරිසිදුව තබා ගැනීමේ යොදවා සිටින (ලියකියවිලි වැඩෙහි නිරත සේවකයන් නොවන) කම්කරුවන් අදහස් කරනු ලැබේ.

(ආ) ''පෝටර්වරු'' යන්නෙන් ලොරි, බස් රථ, කුලී කාර්, කැබ් රථ, වෑන් රථ, ගිලන් රථ හෝ මිනී රථ යන මේවාට බඩු පැටවීමෙහි හෝ ඒවායේ බඩු බෑමෙහි යොදවා සිටින හා ඔවුන්ගේ වැඩ සම්බන්ධයෙන් ඒ රථවලම ගමන් කිරීමට සිදුවන කම්කරුවන් අදහස් කරනු ලැබේ.

## II වැනි කොටස

### මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

| *ආයතනයේ සේවා වර්ෂය* | *ඒ පන්තිය ඩී පන්තිය* | *බී පන්තිය* | *සී පන්තිය* | *ඊ පන්තිය එෆ් පන්තිය ජේ පන්තිය* | *ජී පන්තිය අයි පන්තිය* | *එච් පන්තිය* | *කේ පන්තිය* |
|---|---|---|---|---|---|---|---|
| 1 වන වසර | 12,025.00 | 11,650.00 | 11,240.00 | 10,940.00 | 10,600.00 | 10,340.00 | 10,000.00 |
| 2 වන වසර | 12,225.00 | 11,825.00 | 11,390.00 | 11,065.00 | 10,700.00 | 10,440.00 | 10,100.00 |
| 3 වන වසර | 12,425.00 | 12,000.00 | 11,540.00 | 11,190.00 | 10,800.00 | 10,540.00 | 10,200.00 |
| 4 වන වසර | 12,625.00 | 12,175.00 | 11,690.00 | 11,315.00 | 10,900.00 | 10,640.00 | 10,300.00 |
| 5 වන වසර | 12,825.00 | 12,350.00 | 11,840.00 | 11,440.00 | 11,000.00 | 10,740.00 | 10,400.00 |
| 6 වන වසර | 13,025.00 | 12,525.00 | 11,990.00 | 11,565.00 | 11,100.00 | 10,840.00 | 10,500.00 |
| 7 වන වසර | 13,225.00 | 12,700.00 | 12,140.00 | 11,690.00 | 11,200.00 | 10,940.00 | 10,600.00 |
| 8 වන වසර | 13,425.00 | 12,875.00 | 12,290.00 | 11,815.00 | 11,300.00 | 11,040.00 | 10,700.00 |

| ආයතනයේ සේවා වර්ෂය | ඒ පන්තිය ඩී පන්තිය | බී පන්තිය | සී පන්තිය | ඊ පන්තිය එෆ් පන්තිය ජේ පන්තිය | ජී පන්තිය අයි පන්තිය | එච් පන්තිය | කේ පන්තිය |
|---|---|---|---|---|---|---|---|
| 9 වන වසර | 13,625.00 | 13,050.00 | 12,440.00 | 11,940.00 | 11,400.00 | 11,140.00 | 10,800.00 |
| 10 වන වසර | 13,825.00 | 13,225.00 | 12,590.00 | 12,065.00 | 11,560.00 | 11,240.00 | 10,900.00 |
| 11 වන වසර | 14,025.00 | 13,400.00 | 12,740.00 | 12,190.00 | 11,600.00 | 11,340.00 | 11,000.00 |
| 12 වන වසර | 14,225.00 | 13,575.00 | 12,890.00 | 12,315.00 | 11,700.00 | 11,440.00 | 11,100.00 |
| 13 වන වසර | 14,425.00 | 13,750.00 | 13,040.00 | 12,440.00 | 11,800.00 | 11,540.00 | 11,200.00 |
| 14 වන වසර | 14,625.00 | 13,925.00 | 13,190.00 | 12,565.00 | 11,900.00 | 11,640.00 | 11,300.00 |
| 15 වන වසර | 14,825.00 | 14,100.00 | 13,340.00 | 12,690.00 | 12,000.00 | 11,740.00 | 11,400.00 |

02 - 496/4

---

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

### පොල් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) වන පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ පොල් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව මෙම උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2019 පෙබරවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

ආර්. පී. ආර්. රාජපක්ෂ,
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2019 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

පොල් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1949 අප්‍රේල් මස 30 වැනි දින අංක 9971 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුවා වූ නිවේදනයෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූද, අවසන්වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයෙහි II හා III කොටස් වෙනුවට පහත සඳහන් කොටස් ආදේශ කිරීමෙන් වෙනස් කළ යුතුය.

### II වන කොටස

ආඥා පනතේ 06 වන වගන්තිය යටතේ වූ නිවේදනයේ විස්තර කළ පොල් නිපදවීමේ කර්මාන්තයේ කටයුතුවල ඇතැම් කාර්යයන් සම්බන්ධයෙන් කැලි මිම්මේ වැඩ සඳහා වලංගු වූ අවම වේතන ප්‍රමාණයන් මෙසේ ය.

| *කාර්යය* | *ප්‍රමාණය* | *රු. ශත* |
|---|---|---|
| වේලාපු පොල් නිපදවීමේ දී | | |
| පොල් ලෙලි ගැසීම | ගෙඩි 1,000 | 460.00 |
| කටු ගැලවීම | ගෙඩි 1,000 | 319.00 |
| කුරුටු ගෑම | ගෙඩි 1,000 | 319.00 |
| පොල් මද සේදීම හා කඩ කිරීම | රාත්තල් 1,000 | 278.00 |
| වේලීම (ඩ්‍රයරයෙන්) | රාත්තල් 1,000 | 218.00 |
| වේලීම (ඩෙසිකේටරයෙන්) | රාත්තල් 1,000 | 293.00 |
| හැලීම සහ ශ්‍රේණි කිරීම | රාත්තල් 1,000 | 247.00 |
| ඇහිරීම සහ තහඩු අකුරු ගැසීම | රාත්තල් 120-130 බෑගයක් | 19.00 |

**ගම්බද කර්මාන්තයක් වශයෙන් හැරෙන්නට කෙඳි සහ කොහු නිෂ්පාදන තැනීමේ දී :**

| | | | *රු. ශත* |
|---|---|---|---|
| ලෙලි තැලීම (ඇට කෙඳි කොහු) තෙත පිටින් බර | - | හොන්ඩරයකට | 201.00 |
| ලෙලි කැඩීම හා (ශුද්ධ කිරීම) තෙත පිටින් බර | - | හොන්ඩරයකට | 201.00 |
| ගුදිරි කොහු ශුද්ධ කිරීම, වේලීම සහ මිටි බැඳීම | - | හොන්ඩරයකට | 172.00 |
| ඇට කෙඳි කොහු කැරලි කිරීම සහ බැඳීම | - | හොන්ඩරයකට | 163.00 |

**පැදුරු සහ කළාල තැනීම**

| | | | |
|---|---|---|---|
| පැදුරු වර්ග | - | අඩියකට | 197.00 |
| කළාල වර්ග | - | යාරයකට | 179.00 |
| ඇට කෙඳි කොහු පිරීම සහ බැඳීම | - | හොන්ඩරයකට | 534.00 |

III වන කොටස

**කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණයන්**

මෙහි I වන තීරයෙහි නිශ්චිතව සඳහන් කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා සාමාන්‍ය වැඩ කරන දිනයකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය II වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති ප්‍රමාණයෙන් විය යුතුය.

| | *I වන තීරය*<br>*සේවකයාගේ පන්තිය* | *II වන තීරය*<br>*ප්‍රමාණය*<br>*රු. ශත* |
|---|---|---|
| කපාපු පොල් නිෂ්පාදනය | කංකානමට | 506.00 |
| පොල් තෙල් නිෂ්පාදනය | කම්කරුවෙකුට (ස්ත්‍රී/පුරුෂ) | 488.00 |
| කොහු හා කොහු නිෂ්පාදනය | කම්කරුවෙකුට (ස්ත්‍රී/පුරුෂ) | 425.00 |
| කොහු හා කොහු නිෂ්පාදනය | කංකානමට | 425.00 |

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ඉස්සන් බෝ කිරීමේ හා පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥා පනතේ 30 වැනි වගන්තිය යටතේ ඉස්සන් බෝ කිරීමේ හා පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥා පනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2019 පෙබරවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

**ආර්. පී. ආර්. රාජපක්ෂ,**
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2019 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ 05.

උපලේඛනය

ඉස්සන් බෝ කිරීමේ සහ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1999 අප්‍රේල් මස 04 වැනි දින අංක 1073/26 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තා වූ ද, අවසන් වරට 2013 ජනවාරි මස 03 වැනි දින අංක 1791/28 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්ද වූ උපලේඛනයට පහත සඳහන් කොටස ඇතුළත් කිරීමෙන් වෙනස් කළ යුතුය.

ඉස්සන් බෝ කිරීමේ සහ පිටරට යැවීමේ කර්මාන්තයෙහි නියුක්ත I වන කොටසේ සඳහන් විවිධ ශ්‍රේණි යටතේ දැක්වෙන කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම මාසික ඒකාබද්ධ වේතන ප්‍රමාණය II කොටසෙහි එම ශ්‍රේණියට අනුරූප සටහනෙහි දැක්වෙන ප්‍රමාණය විය යුතුය.

**I වැනි කොටස**

**සේවකයන්ගේ පන්තිය**

**පුහුණු**

මේසන්වරු, වඩුවෝ, ජලය සපයන්නෝ සහ ටැංකිවලින් ජලය පිට කරන්නෝ, පොම්පාගාර පාලකයෝ සහ පොම්පකරුවෝ, ජලය සංසරණය සිදුකරන්නෝ, ඔක්සිජන් සපයන්නෝ, උෂ්ණත්වය පාලනය කරන්නෝ, කෑම විටමින් වර්ග සහ ඖෂධ සපයන්නෝ, සත්ව ආහාර නිකුත් කරන කම්කරුවන් / ගබඩාකරුවෝ, අස්වැන්න බාර ගන්නා අය/ ගබඩාකරුවෝ, හරි වැරදි බලන්නෝ හා තත්ත්ව පාලකවරු, කපන්නෝ, සෝදන්නෝ, ඉස්සන් වර්ග කරන්නෝ, හරි වැරදි බලන්නෝ, ටැංකි සෑදීමේ යෙදෙන කම්කරුවෝ, අස්වැන්න එකතු කරන්නෝ, බෝට්ටු පදවන්නෝ, පැකට්වලට අසුරන්නෝ, ශීත කාමරවල තැන්පත් කරන්නෝ.

**අර්ධ පුහුණු**

භූමිය සකස් කරන කම්කරුවෝ, ටැංකි මුරකරුවෝ සහ භාරකරුවෝ, ලුණු ඇදීම කරන්නෝ, මුද්‍රා තබන්නෝ, සෙලෝපේන් සහ කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, ගල්වැටි දැමීම සහ අඩි පාරවල් සාදන්නෝ.

**නුපුහුණු**

ටැංකි පවිත්‍රකරන්නෝ, ටැංකි සතුන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා නියැලෙන කම්කරුවෝ, ශීත කාමර ශුද්ධ කරන්නෝ සහ අමදින්නෝ.

ඉහත දැක්වෙන ඡේදවල ඇති වැඩවලට සම්බන්ධ වූ හෝ අනියම් වශයෙන් ගැනෙන යම් කාර්යයක නිරත වූ කම්කරුවෝ.

පහත සඳහන් සේවකයන් මෙම පඩිපාලක සභාවෙන් ආවරණය නොවේ.

- 1945 නොවැම්බර් මස 02 වැනි දින අංක 9481 දරන ගැසට් පත්‍රයේ පළවූ ආඥාවෙහි නියමිත මෝටර් රථ ගමනාගමන කර්මාන්තයේ නියුක්ත කම්කරුවෝ - ඒ කර්මාන්තයේ නිර්දේශිත අනුව වරප්‍රසාද හා ගෙවීම් ලැබිය යුතු ය.

- 1944 ජනවාරි මස 07 වැනි දින අංක 9224 දරන ගැසට් පත්‍රයේ පළවූ සහ අනතුරුව සංශෝධනය කරන ලද ආඥාවෙහි නියමිත ඉංජිනේරු කර්මාන්තයේ නියුක්ත කම්කරුවෝ - එම කර්මාන්තයේ නිර්දේශිත වරප්‍රසාද හා ගෙවීම් ලැබිය යුතු ය.

- පහත සඳහන් සේවකයන් මෙම පඩිපාලක සභා තීරණවලින් ආවරණය නොවේ.
ලිපිකරුවෝ, කැෂියර්වරු, වේලා සටහන්කරුවෝ, මුරකරුවෝ.

## II වැනි කොටස

### වැඩ කරන මාසයක් සඳහා වූ අවම වේතන ප්‍රමාණය

| සේවා වර්ෂය | පුහුණු රු. ශත | අර්ධ පුහුණු රු. ශත | නුපුහුණු රු. ශත |
|---|---|---|---|
| 1 වන වසර | 14,340.00 | 13,920.00 | 13,500.00 |
| 2 වන වසර | 14,490.00 | 14,045.00 | 13,600.00 |
| 3 වන වසර | 14,640.00 | 14,170.00 | 13,700.00 |
| 4 වන වසර | 14,790.00 | 14,295.00 | 13,800.00 |
| 5 වන වසර | 14,940.00 | 14,420.00 | 13,900.00 |

02 - 496/6

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.